## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2017

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගනුදෙනු හා ක්‍රියාකාරකම් 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් පිළිබඳව පාර්ලිමේන්තුවට සභාගත කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වුවත් 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 සංස්ථාවේ ක්‍රියාකාරකම් පිළිබඳ අදහස්

---

### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම්

---

2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.886,178,453 ක් වූ ගෙවිය යුතු බදු සඳහා වයස් විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,839,674,961 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 95 කට වැඩි ප්‍රතිශතයක් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතුව තිබූ අතර ඉන් රු.1,228,553,068 ක් හෙවත් සියයට 43 ක් ආපසු අයකර නොගෙන වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් රැඳී පැවතුණි.

(ආ) වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට විවිධ ණයගැතියන් ලෙස රු.7,450,055 ක වටිනාකමක් අඛණ්ඩව ගිණුම්වලට ගෙන තිබුණද අදාල පාර්ශව හඳුනාගැනීමට හෝ අදාල වටිනාකම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විවිධ පාර්ශව වෙත විවිධ අරමුණු සඳහා දෙන ලද එකතුව රු.410,933,309 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකරගෙන නොතිබුණු අතර ඉන් රු.144,944,204 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට ආපසු අයකර නොගෙන රැඳී පැවතුණි.

(ඈ) ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂ එකතුව රු.226,121,330 ක් හා රු.116,549,944 ක් පිළිවෙලින් වර්ෂ 03 ත් 05 ත් අතර කාලයක් හා වර්ෂ 05 ක් ඉක්මවා නොපියවා රැඳී පැවතුණි.

(ඉ) බැර ශේෂ එකතුව රු.1,807,107 ක් හා හර ශේෂ එකතුව රු.491,749 ක් තනි තනිව හඳුනා නොගෙන ණයහිමියන් තුළ දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛනයේ දක්වා තිබුණු ණයගැති ශේෂ 05 ක් හා අදාල ණයගැතියන්ගෙන් ලද ණයගැති ශේෂ තහවුරු කිරීම් අතර එකතුව රු.296,807,702 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් සඳහා හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) | මුදල් රෙගුලාසි 396 (ඈ) | 2017 දෙසැම්බර් 31 දිනට නිකුත්කර මාස 06 ක කාලයක් ඉක්මවූ වටිනාකම රු.380,936 ක් වූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 233 (1) | රු.169,539,789 ක ශ්‍රම උපකොන්ත්‍රාත් අත්තිකාරම් උප කොන්ත්‍රාත්කරුවන්ගෙන් ආපසු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි | සමාලෝචිත වර්ෂයේ භෞතික තොග සමීක්ෂණය අනුව ඒකල වැඩබිමේ තොග අයිතම 6,130 කට අදාලව එකතුව රු.5,632,278 ක තොග ඌණතාවයක් නිරීක්ෂණය විය. තවද, අතිරික්ත තොග අයිතම 2,957 කට අදාලව වටිනාකම රු.2,886,019 ක තොග අතිරික්ත එම වැඩබිමෙන් නිරීක්ෂණය විය. |
| (ආ) | | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | 2006 ජනවාරි සිට 2015 ජුලි දක්වා ජීවන වියදම් දීමනාව සේවකයින්ට ගෙවීම මත සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකය පිළිවෙලින් රු. මිලියන 307.82 ක් හා රු. මිලියන 41.97 ක් ප්‍රේෂණය නොකිරීම නිසා අධිභාර ලෙස පිළිවෙලින් රු.මිලියන 153.91 ක් හා රු.මිලියන 20.98 ක් සංස්ථාවට ගෙවීමට සිදු වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1979 දෙසැම්බර් 20 දිනැති හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය | ඇණවුම් සමඟ චෙක්පත් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවත් රු.89,503,424 ක් වූ එලෙස ලබාදුන් අත්තිකාරම් වර්ෂ 03කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) මාර්ගෝපදේශය | රු.500,000 ක වටිනාකම ඉක්මවන භාණ්ඩ හා සේවා සැපයීමේදී ලිඛිත ගිවිසුමක් අත්සන් කළ යුතුය. කෙසේ වුවද, සිද්ධීන් 13 ක් තුළ එවැනි ගිවිසුමක් අත්සන් කිරීමෙන් තොරව රු.මිලියනයකට අධික මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සංස්ථාවේ ප්‍රධාන අරමුණු වූ (i) සිවිල් ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ෂනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම (ii) ව්‍යාපෘති කළමනාකරණ සේවා හා උපදේශන සේවා සැපයීම (iii) දේපල සංවර්ධන කටයුතු අත්පත් කර ගැනීම (iv) පෙර සූදානම් කළ කොන්ක්‍රීට්, සවි ගැන් වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යබල කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම (v) ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය හා ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම හා අපනයනය කිරීම (vi) ඉංජිනේරුමය හා ශිල්පීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම (vii) ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය, ඉදිකිරීම් විධික්‍රම හා ඉදිකිරීම් ශිල්පක්‍රම පිළිබඳ පර්යේෂණ කටයුතු ක්‍රියාවේ යෙදවීම වේ.

2017 වර්ෂයේදී ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු. 198,661,125 ක සවලීකරණ අත්තිකාරම් 2010 වර්ෂයේ සිට ලැබී තිබු නමුත්, එම සවලීකරණ අත්තිකාරම් සඳහා වැඩ සිදුකර දී නොතිබුණි.

(ආ) විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපකොන්ත්‍රාත්කරුවන් වෙත දෙන ලද සවලීකරණ අත්තිකාරම් එකතුව රු. 2,945,423,776 ක් වර්ෂ 5ට වඩා වැඩි කාලයක සිට අයකර නොගෙන පැවතුණු අතර එම ව්‍යාපෘති එකඟ වූ කාලය තුල සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති වැඩ ක්‍රියාත්මක කිරීමේ අකාර්යක්ෂමතාවය නිසා සංස්ථාව විසින් එකතුව රු. 308,255,164 ක අලාභයක් දරා තිබුණු අතර 2017 වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘතිවලින් රු. 1,376,888,537 ක සමුච්චිත අලාභයක් දරා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව තිබු පහත සඳහන් උපායමාර්ග සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වී නොතිබුණි.

උපායමාර්ග:-

(i) සියලු ගොඩනැගිලි සැලසුම්වල සියයට 20 ක බලශක්ති ඉතිරි කිරීම් පවත්වා ගැනීම.

(ii) වාරිමාර්ග, ජල සම්පාදන හා අනෙකුත් ඉදිකිරීම් නිෂ්පාදන ආශ්‍රිත පෙරසවි නිෂ්පාදනවල වර්තමාන

නිෂ්පාදන මට්ටම සියයට 5කින් වැඩි කිරීම.

ක්‍රියාකාරකම්:- (i) පවත්වාගෙන යන ව්‍යාපාර අඛණ්ඩව පරික්ෂා කිරීම.
(ii) තාක්ෂණික විගණනය.

### 3.1.1 සංස්ථාවේ අනිකුත් අංශවල මෙහෙයුම් කාර්යසාධනය

ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය, විශේෂ මෙහෙයුම් අංශය සහ උපදේශන අංශය යන අංශ 5ක් යටතේ සංස්ථාව ක්‍රියාත්මක වන අතර එක් එක් අංශයේ සාරාංශගත කාර්යසාධන පහත දැක්වේ.

#### (අ) ඉදිකිරීම් අංශය

(i) සමාලෝචිත වර්ෂය තුල මෙම අංශය යටතේ ක්‍රියාත්මක වූ මාලිගාවත්ත යන්ත්‍රෝපකරණ කුලියට ලබා දීමේ වැඩබිමෙන් ආදායමක් ජනනය වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මෙම අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ කෙරීගෙන යන ව්‍යාපෘති 23 ක් අතරින් ව්‍යාපෘති 20කින් එකතුව රු. 44,310,106 ක ලාභයක් වාර්තා කර තිබුණු අතර ව්‍යාපෘති 3කින් එකතුව රු. 319,716,399 ක අලාභයක් වාර්තා වී තිබුණි. එමනිසා කෙරීගෙන ගිය ව්‍යාපෘතිවලින් එකතුව රු. 275,406,293 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි.

#### (ආ) ඉදිකිරීම් උපාංග අංශය

පෙර වර්ෂය හා සැසඳීමේදී රත්මලානේ පිහිටි පෙරසවි අංගනයේ මෙහෙයුම් ලාභය සියයට 41කින් පිරිහීමට ලක්ව ඇති බව නිරීක්ෂණය විය. තවද, දංකොටුව වඩු නිෂ්පාදන අංගනයේ විකුණුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 26කින් අඩු වී ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ අලාභය සියයට 22කින් වැඩි වී තිබුණි. මේ අතර, දෙමටගොඩ කොන්ක්‍රීට් සිල්පර අංගනයේ හා වැලිකන්ද පෙරසවි අංගනයේ ශුද්ධ ලාභය පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 32 ක් හා සියයට 90කින් පිරිහීමට ලක්ව තිබුණි.

#### (ඇ) යාන්ත්‍රික හා විදුලි අංශය

(i) පැලියගොඩ පිහිටි මෙහෙයුම් අංගනය (වැඩබිම් අංක 104) 2013 වර්ෂයේ සිට අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 23 ක ශුද්ධ අලාභයක් වාර්තා වී තිබුණි.

(ii) මාතලේ පිහිටි ඩොලමයිට් සැකසුම් වැඩබිම (වැඩබිම් අංක 1100) 2006 වර්ෂයේදී හැර වර්ෂ 18 ක් අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ අලාභය සියයට 76කින් ඉහල ගොස් තිබුණි.

#### (ඈ) විශේෂ මෙහෙයුම් අංශය

ගලපාත ඇස්පෝල්ට් වැඩබිම සඳහා අමුද්‍රව්‍ය සැපයීමට සමාලෝචිත වර්ෂය තුළ රු. 29,642,269 ක වටිනාකමක් සැපයුම්කරුවන්හට ගෙවා තිබුණු අතර රු.13,016,723 ක වටිනාකමකින් යුක්ත අමුද්‍රව්‍ය ගිවිසුම්ගත පරිදි සැපයුම්කරුවන් විසින් සපයා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩබිමෙන් ආදායමක් ජනනය වී නොතිබුණි.

**3.1.2 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය විසින් ඉල්ලුම් කරන ලද එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තුවලට අදාල තොරතුරු ඉදිරිපත් නොවුණි. එමනිසා, එම බදු සඳහා ගෙවියයුතු සැබෑ ශේෂයන් සතුටුදායක ලෙස විගණනයේදි නිශ්චය කිරීමට නොහැකි විය.

(ආ) එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම පිළිවෙලින් රු. මිලියන 123.84 ක් හා රු. මිලියන 7.8 ක් සංස්ථාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2002 සිට 2011 කාලපරිච්ඡේදය දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවීමට තිබුණු රු. මිලියන 235.8 ක් ගෙවා නොතිබුණි.

(ඈ) දකුණු පළාතේ ජාතික යොවුන් සේනාංකයේ සිදුකළ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) උපකොන්ත්‍රාත් ලිපිගොනු තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 5කට අදාල කාර්යසාධන තොරතුරු ලබා දී නොතිබුණු අතර, අදාල වැඩ කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සඳහා ඇවර කිරීමේ අලාභ උපකොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි. තවද, උපකොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ ක්‍රියාපිළිවෙල විගණනය සඳහා ලබා නොදෙන ලදී.

(ii) 2008 පෙබරවාරි 06 දිනැති අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයේ කොන්දේසි අනුව සංස්ථාව සාකච්ඡා මාර්ගයෙන් ලබා ගන්නා කොන්ත්‍රාත් සංස්ථාව විසින්ම සිදු කිරීමේදී ඒ සඳහා ලබාදිය යුතු අත්තිකාරම් බැඳුම්කර හා කාර්යසාධන / ආරක්ෂක බැඳුම්කරවලින් සංස්ථාව නිදහස් කර තිබුණි. කෙසේ වුවද, සංස්ථාව විසින් සිදුකරනු ලබන වැඩ කටයුතු උපකොන්ත්‍රාත් යටතේ සිදුකරන විට මෙම සහනය අදාල නොවිය යුතු විය. කෙසේ වෙතත්, උපකොන්ත්‍රාත්කරුවන්ගෙන් අදාල බැඳුම්කර ලබා නොගෙන ජාතික යොවුන් සේනාංකයේ ඉදිකිරීම් උපකොන්ත්‍රාත් ලබා දී තිබුණි.

(iii) ඉදිකිරීම් වැඩ 21 ක් අතරින් විවිධ වර්ගයේ ඉදිකිරීම් වැඩ 13 ක් රු. 12,222,509 බැගින් උපකොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණු අතර, ඉදිකිරීම් ව්‍යාපෘති 8 ක් රු.3,121,253 බැගින් ලබා දී තිබුණි. මේ සඳහා හේතු වූ කරුණු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(iv) ජාතික යොවුන් සේනාංකයෙන් ලද කොන්ත්‍රාත් වැඩ 3 ක් සියයට 28 ත් සියයට 34 ත් අතර අසාමාන්‍ය ලාභ ආන්තිකයක් යටතේ උපකොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණු බව විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඉ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 344 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව 785 ක් විය. එහෙත්, අතිරික්ත සේවකයින් 441 සඳහා ආයතනය විසින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නව තනතුරු 33 ක් නිර්මාණය කර තිබුණු අතර සේවකයින් 62 ක් එම අනුමැතිය නොලත් තනතුරු 33 සඳහා පත්කර තිබුණි.

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) යාන්ත්‍රික හා විදුලි, ඉදිකිරීම් උපාංග හා ඉදිකිරීම් අංශ මඟින් ක්‍රියාත්මක වූ මුළු වටිනාකම රු. මිලියන 5,570.74 ක් වූ ව්‍යාපෘති 88 ක් 2015 වර්ෂයට පෙර සම්පූර්ණ කළ යුතුව තිබුණි. කෙසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ ලාභ ගණන වාර්තාවට අනුව එම ව්‍යාපෘති සියයට 20 ට අඩු සම්පූර්ණ කරන ලද මට්ටමේ, සියයට 20 – 90 ත් අතර සම්පූර්ණ කරන ලද මට්ටමේ දක්වා තිබුණි. මේ අතර, සමාලෝචිත වර්ෂයේ ලාභ ගණනය කිරීමේදී වටිනාකම රු. මිලියන 149.17 ක් වූ ව්‍යාපෘති 2 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂය තුල ව්‍යාපෘති 03 ක් අවසන් කර තිබුණද, යාන්ත්‍රික හා විදුලි අංශය යටතේ ක්‍රියාත්මක මාර්ග හා පාලම් පිරියත විසින් 2016 හා 2017 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 12,651,414 ක් හා රු. 20,903,794 ක් වියදම් දරා තිබුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශය, ඉදිකිරීම් උපාංග අංශය හා ඉදිකිරීම් අංශය විසින් 2015 වර්ෂයට පෙර සම්පූර්ණ කළයුතු ව්‍යාපෘති 34 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් රු. 11,479,060, රු. 1,480,131 ක් හා රු. 25,411,302 ක වියදම් දරා තිබුණි. එම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 22 ක් රු. 1,545,626 ක ලාභයක් පෙන්නුම් කර ඇති අතර ව්‍යාපෘති 2කින් රු. 35,959,748 ක අලාභයක් වාර්තා කර තිබුණි.

(ඈ) ඉදිකිරීම් අංශය විසින් 2015 වර්ෂයේ හෝ 2015 වර්ෂයට පෙර ආරම්භ කළයුතු මුළු වටිනාකම රු. 232,766,966 ක් වූ ව්‍යාපෘති 8 ක් විගණිත දිනය වූ 2018 ඔක්තෝම්බර් 11 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. කෙසේ වුවත්, ලාභය ගණනය කිරීමේ වාර්තාවේ එම ව්‍යාපෘතිවලින් කිහිපයක් සියයට 20 ට අඩු නිම කළ මට්ටමේ දක්වා තිබුණි.

**3.3 අනිකුත් රාජ්‍ය ආයතනවලට මුදාහැර තිබූ සම්පත්**

**------------------------------------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට, පළාත් අමාත්‍යාංශයට හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සංස්ථාවේ සේවකයින් 20 ක් මුදාහැර තිබුණි. ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම සේවකයින්ගේ වැටුප් අදාල ආයතනවලින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. කෙසේ වුවද, 2018 සැප්තැම්බර් 30 දින වන විටත් සේවකයින් 11 දෙනෙකුට අදාලව 2016 හා 2017 වර්ෂය සඳහා සංස්ථාව විසින් ගෙවූ රු. 7,271,960 ක් හා රු. 3,380,420 ක වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**3.4 නිෂ්කාර්ය වත්කම්**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සී - සිටී ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඒ සඳහා භාවිතා කරන ලද ඉඩම නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ප්‍රධාන ගබඩාවේ අවසාන තොගයට නොගත් හා භාවිතයට නොගත් සංස්ථාවට අයිති ඇළුමිනියම් බාර් හා සිවිලින් ෂීට් තොගයක් පැවතුණි.

## 3.5 හඳුනාගන්නා ලද පාඩු

එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු නියමිත කාලය තුළ නොගෙවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත රු.114,399,641 ක අධිභාරයක් පනවා තිබුණි. එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු පිළිවෙලින් රු. 628,504,287 ක්, රු. 67,996,943 ක් හා රු. 15,130,647 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 හා 2011 වර්ෂවලදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ බොහොමයක් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සංස්ථාවට ලැබී තිබුණි. කෙසේ වුවත්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 6 ක් සඳහා නිලධාරීන් 29 දෙනෙකු ඉහල වැටුප් තලයන් යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. තවද, සුපරීක්ෂකවරු (සිවිල්) 49 ක් ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය අනුව පත්කිරීමක් කළ යුත්තේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරුවලට පමණි. නමුත්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 39 ක් සඳහා අතිරික්ත සේවකයින් 850 දෙනෙකු 2017 දෙසැම්බර් 31 දිනට බඳවාගෙන තිබුණි.

(ඇ) 2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (II) සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නව තනතුරු ඇති කිරීම හෝ පුරප්පාඩු පිරවීම නොකළයුතු බව දැනුවත් කර තිබුණි. කෙසේ වුවත්, අනුමැතිය ලබා නොගත් තනතුරු 10 ක් සඳහා සේවකයින් 13 ක් පත්කර තිබුණි.

# 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද සමාලෝචිත වර්ෂයට අදාලව යාවත්කාලීන කර නොතිබුණි. සංයුක්ත සැලැස්මෙහි ඇතුළත්ව තිබූ අරමුණු හා පරමාර්ථ ලඟා කරගැනීම සඳහා අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය විය.

සංයුක්ත සැලැස්ම තුළ වූ පහත සඳහන් ඉලක්ක අපේක්ෂිත පරිදි ඉටු කරගෙන නොතිබුණි.

(අ) සංස්ථාවේ එක් එක් අංශයේ සාමාන්‍ය වාර්ෂික අවම ආදායම සියයට 5කින් වැඩි කිරීම සහ ව්‍යාපෘතිවලින් සියයට 5 ක වාර්ෂික අතිරේක ආදායමක් උපයා ගැනීම.

(ආ) ණය ආපසු අය කිරීම සඳහා පද්ධතියක් හඳුන්වා දීම සහ වර්තමාන ණය මට්ටම සියයට 20 කින් අඩු කිරීම.

(ඇ) නව ආදායම් ඉපයීම් ක්ෂේත්‍රයන් හා ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම යටතේ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම.

**4.2 ක්‍රියාකාරි සැලැස්ම**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකසා තිබුණද, එම ක්‍රියාකාරි සැලැස්ම තුළ සඳහන් අරමුණු, උපායමාර්ග සහ ක්‍රියාකාරකම් සපුරා ගැනීම සඳහා ගතවන කාලය නිර්ණය කර නොතිබුණි. පහත සඳහන් මූලික අයිතම ඇතුළත් කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(i) ආදායම, මෙහෙයුම් වියදම්, සංවර්ධන වියදම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තා හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුලත් වූ වාර්ෂික අයවැය.

(ii) යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා ඉහල නැංවීම හා ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුළත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.

(iii) මානව සම්පත් සංවර්ධන සැලැස්ම.

(iv) ණය ආපසු ගෙවීමේ සැලැස්ම.

(v) අභ්‍යන්තර විගණන සැලැස්ම.

**4.3 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 46 සිට සියයට 70 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් 2015 හා 2016 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2018 ජූලි 20 දින වන විටත් පාර්ලිමේන්තුවට සභාගත කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණන කටයුතු තුලදී පද්ධති හා පාලනයන්හි නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන අංශ හා පාලනයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් අවශ්‍ය වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) ඇණවුම් සමඟ චෙක්පත් මඟින් අත්තිකාරම් ලබා දීම.<br>(ii) වර්ෂ ගණනාවක සිට පැවත එන ණයගැතියන්ගෙන් මුදල් අයකර නොගෙන පැවතිම.<br>(iii) සේවාදායකයින් සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කිරීමට සැලකිය යුතු ප්‍රමාදයන් පැවතීම.<br>(iv) ගැණුම් අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලයක සිට පැවතීම. |

| | | | |
|---|---|---|---|
| | | (v) | ඉදිකිරීම්වලට අදාල දිගුකාලීන රඳවා ගැනීම් මුදල් නිරවුල් කිරීමට අපොහොසත් වීම. |
| (ආ) | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | (i) | දිගු කාලයක සිට නිරවුල් නොකරන ලද සවලීකරණ අත්තිකාරම් පැවතීම. |
| | | (ii) | නියමිත කාලය තුල බදු ගෙවීමට අපොහොසත් වීම තුළ අධිභාර ගෙවීමට සිදුවීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | වෙනත් ආයතන වෙත මනව සම්පත් මුදා හැරීම. |
| | | (ii) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම. |
| | | (iii) | ජ්‍යෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් කිරීම. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | | ඉඩම් අයිතිය පවරා ගැනීමට හා නිෂ්කාර්ය වත්කම් විධිමත් පරිදි උපයෝජනය කිරීමට කටයුතු කිරීමට අපොහොසත් වීම. |
| (ඉ) | තොග පාලනය | | සියළුම වැඩබිම්වල වාර්ෂික තොග සමීක්ෂණ සිදු කිරීමට අපොහොසත් විම. |